# 18

# ලැජ්ජා ශීලී බව

ඉස්ලාම් යහගුණාංගවලින් සමන්විත ආගමකි. එය සෑම මුස්ලිම්වරයකු ම යහගුණාංගයෙන් යුතු අයකු විය යුතු යැයි බලාපොරොත්තු වෙයි. මුස්ලිම්වරයකු ළඟ තිබිය යුතු අලංකාර යහගුණාංග ගැන අල්- කුර්ආනය සේ ම සුන්නාහිත් බොහෝ ස්ථානවල අවධාරණය කෙරේ.

මෙසේ මුස්ලිම්වරයකු ලබා තිබිය යුතු යහගුණාංගවලින් ලැජ්ජාව ඉතා වැදගත් එකකි. ලැජ්ජාව යනු පහත් ක්‍රියා කිරීම වළක්වා ගන්නා ගුණාංගයකි. අල්ලාහ් හා නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් විසින් පහත් ක්‍රියා පිළිබඳ පැහැදිලි කර ඇත. නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් ලැජ්ජාශීලී අයකු ලෙස ජීවත් වී ඇත. ලැජ්ජාශීලී ක්‍රියා ගැන නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණන් පැවසූ සමහර හදීස් වදන් සලකා බලමු.

## ලැජ්ජාශීලී බව ඊමානයේ ශාඛාවලින් එකකි.

قَالَ النَّبِيُّ صَلَّى اللَّهُ عَلَيهِ وَسَلَّم:

اَلْإِيْمَانُ بِضْعٌ وَسِتُّوْنَ، أَوْ : بِضْعٌ وَسَبْعُوْنَ ، شُعْبَةً ، أَعْلَاهَا شَهَادَةُ أَنْ لَا إِلَهَ إِلَّا اللَّهُ ، وَأَدْنَاهَا إِمَاطَةُ الْأَذَى عَنِ الطَّرِيقِ ، وَالْحَيَاءُ شُعْبَةٌ مِنَ الْإِيمَانِ (رواه البخاري ومسلم)

නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණෝ පැවසූහ.

ඊමානයේ 70කටත් අධික නැතහොත් 60කටත් අධික ශාඛා ඇත. එයින් උසස් "ලා ඉලාහ ඉල්ලල්ලාහ්" යන්නයි. එයින් පහළම වනුයේ පාරේ බාධකයක් වී ඇති දේ ඉවත් කිරීමයි. ලැජ්ජාශීලී බව ඊමානයේ ශාඛාවලින් එකකි. (මූලාශ්‍රය : බුහාරි මුස්ලිම්)

## ලැජ්ජාශීලී බව හා ඊමානය එකිනෙක හා බැඳුණු ඒවා ය.

قَالَ النَّبِيُّ صَلَّى اللَّهُ عَلَيهِ وَسَلَّم:

«الحَيَاءُ وَالإِيمَانُ قُرِنَا جَمِيعًا، فَإِذَا رُفِعَ أَحَدُهُمَا رُفِعَ الآخَرُ» (رواه الحاكم)

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ පැවසූහ. ලැජ්ජාශීලී බවත්, විශ්වාසයත් එකට බැඳුණු ඒවා ය. එක් ගුණාංගයක් ගිලිහී ගිය විට අනෙක් ගුණාංගය ද ගිලිහී යයි. (මූලාශ්‍රය : හාකිම්)

## ලැජ්ජාශීලී බව සෑම විට ම යහපතක් ම උදාකර දෙයි.

قَالَ النَّبِيُّ صَلَّى اللَّهُ عَلَيهِ وَسَلَّم:

الحَيَاءُ لَا يَأْتِيْ إِلَّا بِخَيْرٍ (رواه البخاري ومسلم)

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ පැවසූහ. ලැජ්ජාශීලී හැඟීම සැමවිටම යහපත උදා කරයි. (මූලාශ්‍රය : බුහාරි මුස්ලිම්)

## ලැජ්ජාශීලී බව අලංකාරය උදාකරයි (කරවයි)

قَالَ النَّبِيُّ صَلَّى اللَّهُ عَلَيهِ وَسَلَّم:

«مَا كَانَ الحَيَاءُ فِي شَيءٍ إِلَّا زَانَهُ، وَلَا كَانَ الفُحْشُ فِي شَيءٍ إِلَّا شَانَهُ» (رواه الترمذى)

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ පැවසූහ. යම් කාර්යයක් තුළ ලැජ්ජාශීලී බව තිබේ ද? එම ක්‍රියාව අලංකාරය උදා කරයි. තව ද මොන යම් ක්‍රියාවක් තුළ ලැජ්ජාශීලී බව නොමැති ද එම ක්‍රියාව අවමන් ළඟා කර දෙයි. (මූලාශ්‍රය : තිර්මිදි)

## ලැජ්ජාශීලී බව නොමැති නම් එය නිරයට ඇද දමයි

قَالَ النَّبِيُّ صَلَّى اللَّهُ عَلَيهِ وَسَلَّم:

الْحَيَاءُ مِنَ الْإِيمَانِ وَالْإِيْمَانُ فِي الْجَنَّةِ , وَالْبَذَاءُ مِنَ الْجَفَاءِ وَالْجَفَاءُ فِي النَّارِ (رواه الترمذى)

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාණෝ පැවසූහ. (ලැජ්ජාව ඊමානයේ දෙයකි). ඊමාන් ස්වර්ගයට රැගෙන යයි. ලැජ්ජා නොමැති ව අසභ්‍ය වචන කථා කරන මිනිස්සු ජනයාගේ ප්‍රතික්ෂේප කිරීමට ලක්වෙති. ජනයා ප්‍රතික්ෂේප කළ අය නිරයට යති. (මූලාශ්‍රය : තිර්මිදි)

මේ හදීස් ලැජ්ජා සහගත හැඟීම් මුස්ලිම්වරයකුගේ ජීවිතයෙහි කොතරම් වැදගත් ද යනුවෙන් අපට හඟවයි. ලැජ්ජා සහිත හැඟීම් නැති වූ විට කෙනෙක් කෙබඳු පවක් වුව ද කිරීමට පෙළඹේ.

එම නිසා, අපගේ ජීවිතයේ සෑම මොහොතක ම ලැජ්ජා සහිත හැඟීම් රැක ගනිමු. තමන්ගේ කථාවේ, බැල්මේ, ප්‍රශ්න කිරීමේ දී, ඇවිදීමේ, ඇඳුමේ, භාවිතයේ, සෑම දෙයකින් ම ලැජ්ජා සහිත හැඟීම් සමඟ ක්‍රියා කළ යුතු ය. අල්ලාහ් මෙන් ම සෙසු මිනිසුන් ද කැමති වන පරිදි හොඳ මිනිසුන් ලෙස ජීවත් වී අපි ද දෙලොවේ ම ජය ලබමු.

## අභ්‍යාසය

**හරි නම් ☑ ලකුණ ද වැරදි නම් ☒ ලකුණ ද යොදන්න.**

1. ලැජ්ජාශීලී බව ඊමානයේ ශාඛාවකි. ( )
2. ඊමානයට පියවර කිහිපයක් නොමැත. ( )
3. ලැජ්ජාශීලී හැඟීම් නොමැති පුද්ගලයාගේ ඊමානය සම්පූර්ණ නොවේ. ( )
4. ලැජ්ජාව නොමැතිකම මුස්ලිම්වරයෙකු නිරයට ඇද දැමීමට හේතුවේ. ( )
5. අසභ්‍ය වචන ප්‍රකාශ කිරීම ලැජ්ජාශීලී බවේ ගුණාංගය කි. ( )

## ක්‍රියාකාරකම්

ලැජ්ජාශීලී බව ගැන හඳුන්වන ඉහත සඳහන් හදීස් ලියා ඒවායේ තේරුම් සමඟ කට පාඩම් කරන්න.